# මුහම්මද් නබි තුමාගේ උතුම් ගුණාංග

﴿ أخلاق الرسول صلى الله عليه وسلم وهديه في التعامل مع الناس ﴾

[ Sinhalese – سنهالي ]

පරිවර්තනය: මුහම්මද් නලීම් ඉස්සදීන

2011 - 1432

IslamHouse.com

# ﴿ أخلاق الرسول صلى الله عليه وسلم وهديه في التعامل مع الناس ﴾

« باللغة السنهالية »

ترجمة: محمد نظيم عز الدين

2011 - 1432

IslamHouse.com

# أخلاق الرسول

## صلى الله عليه وسلم

## وهديه في التعامل مع الناس

( باللغة السنهالية )

ترجمة : محمد نظيم عزالدين

# මුහම්මද් නබි තුමාගේ උතුම් ගුණාංග

සහ

## මානව සබඳතා

පරිවර්තනය

එම්. නලීම් ඉස්සදීන්

المكتب التعاوني للدعوة وتوعية الجاليات بالربوة
ISLAMIC PROPAGATION OFFICE IN RABWAH
P.O.BOX 29465 RIYADH 11457 - TEL 4454900 - 4916065
FAX 4970126 - E-Mail:rabwah@www.com

## أخلاق الرسول صلى الله عليه وسلم وهديه في التعامل مع الناس ( باللغة السنهالية )

**<u>විශ්වාස වන්තයිනි! මුහම්මද් නබි (ﷺ) තුමාණන් ඔබ සැම බැහැදැකීමට පෙරුම් පුරයි.</u>**

අබූහුරෙරා (රලි) තුමා වාර්තා කරන හදීසයක මෙසේ සඳහන් වේ. මුහම්මද් නබි (ﷺ) තුමාණන් වරක් සුසාන භූමියකට පැමිණි අවස්ථාවේදී මෙසේ පැවැසූහ. සොහොන් ගැබ් තුල සැතැපෙන විශ්වාස වන්තයිනි! ඔබ සැමට අල්ලාහ්ගේ ශාන්තිය හා සමාදානය ඇති වේවා! ඉන්ශා අල්ලාහ් අප සැමද ඔබ සැම සමග එක්වීමට නියමිතයි. දවසක් දා අප සහෝදරයින් හමුවීමට අපේක්ෂා කරමි.

එවිට සහාබාවරුන් නබි තුමාණනි! අපි ඔබ තුමාගේ සහෝදරවරුන් නොවේද? යනුවෙන් පැවැසූහ, එවිට මුහම්මද් නබි (ﷺ) තුමාණන් "ඔබලා මගේ මිත්‍ර සොහොයුරන්ය. මගේ සහෝදරයින් මෙතෙක් පැමිණියේ නැත" යනුවෙන් පවසා ඔවුහු විනිශ්චය දිනයේදී වුදු කිරීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් ඔවුන්ගේ අවයවයන් ප්‍රභාශ්වර එළියකින් යුක්තව මා හමුවට පැමිණෙති. ඔවුන් සඳහා හව්ද් හෙවත් ජල තටාකයෙන් ජලය සැපැයීමට මා සූදානමින් සිටිමි. (සාධක ග්‍රන්ථය : මුස්ලිම්)

සහෝදර මුස්ලිම්වරුනි! ඔබ සැම බැහැදැකීමට පෙරුම් පුරාගෙන සිටින නබි (ﷺ) තුමාණන්ගේ ආදර කරුණාවෙහි හැඟුම් බර උපහාරයට මහෝපකාරයක් ඔබ විසින් කළ යුතු නොවේද? එතුමා විසින් දේශනා කොට වදාල පහත සඳහන් රුවන් වැකිය ඔබේ ජීවිතය සමග මුසු කළ යුතු නොවේද? එනම් " මගේ ජනසමාජයෙහි මට ඉතා ලැදි ජනයා කවුරුන්ද යත් මගේ (වියෝවෙන්) පසු පැමිණෙන ජනයන් වේ. ඔවුහු ඔවුන්ගේ මිළ මුදල් සම්පත්, ඥාති හිතවතුන්ට වඩා මා හමුවීම ප්‍රිය කරති. (ග්‍රන්ථය: මුස්ලිම්)

**<u>මුහම්මද් නබි (ﷺ) තුමාණන් අපහාසයට ලක් කරන ජනතාවට ඔබ විසින් පෙරලා නිසි පිළිතුරක් ලබා දෙන්නේ කෙසේද?</u>**

ඇත්ත වශයෙන්ම වචනයෙන් පිළිතුරු දීමට වඩා ඔබ කළ යුත්තේ ඔවුන්ට ආදර්ශමත් වීමයි. එනම් ඔබ විසින් මුහම්මද් නබි (ﷺ) තුමාණන්ගේ උතුම් ගුණාංග, එතුමාගේ අවවාද අනුශාසනා සහ මග පෙන්වීම් අනුගමනය කළ යුතු අතර ඒ අනුව ඔබේ ජීවිතයද ගොඩ නගා ගතයුතුයි. එවිට එතුමාගේ චරිතය ඝාතනය කරන සහ එතුමාට විරුද්ධව නැගී සිටින බලවේග අබල දුබල වන අතර ඔවුන්ගේ බලාපොරොත්තු සුනු විසිනු වීමේ හේතුවෙන් ඔවුහු පළා යනු ඇත.

( فَاصْدَعْ بِمَا تُؤْمَرُ وَأَعْرِضْ عَنِ الْمُشْرِكِينَO إِنَّا كَفَيْنَاكَ الْمُسْتَهْزِئِينَ O الَّذِينَ يَجْعَلُونَ مَعَ اللّهِ إِلـهًا آخَرَ فَسَوْفَ يَعْمَلُونَO وَلَقَدْ نَعْلَمُ أَنَّكَ يَضِيقُ صَدْرُكَ بِمَا يَقُولُونَO فَسَبِّحْ بِحَمْدِ رَبِّكَ وَكُن مِّنَ السَّاجِدِينَO وَاعْبُدْ رَبَّكَ حَتَّى يَأْتِيَكَ الْيَقِينُ ) سورة الحجر

**ඔබට අණ කළ දේ (කිසිදු බියකින් තොරව) ඔවුන්ට පැහැදිලිව පවසන්න, (අල්ලාහ්ට) සමාන තබන්නන් ප්‍රතික්ෂේප කරන්න O ඔබ අපහාසයට ලක් කරන්නන් හට (අඩුවම් දීමට) අපි ඔබ සමග පිහිටට සිටිමු O ඔවුහු කව්රුන්ද යත් වන්දනාමානය සඳහා අල්ලාහ් සමග තවත් දෙවියෙකු පත් කර ගනිති (මෙහි විපාකය) ඔවුහු පසුව දැනගනිති O ඔබ අපහාසයට ලක් කරමින් ඔවුන් පවසන දේ නිසා ඔබේ සිත වේදනාවට ලක් වන බව නිසකවම අපි දනිමු O එබැවින් ඔබ ( ඔවුන් පවසන දේ නිසා සිතෙහි අනවශ්‍ය කළබලයක් ඇති නොකර) ඔබගේ ආරක්ෂකයානන්ගේ ප්‍රශංසාව මුල් කරගෙන ඔහුට ස්තෝත්‍ර කරන්න O තවද (ඔහුට සිරස නමා) සුජූද් කරන්නන් අතර කෙනෙකු වන්න O ඔබට (යකීන් හෙවත්) මරණය පැමිණෙන තුරු අල්ලාහ්ට නැමැදුම් කරන්න O (සූරතුල් හිජ්ර්)**

මුහම්මද් නබි (ﷺ) තුමානන් දේහ ලක්ෂණය අතින්ද ගතිගුණයෙන් ද සියළු දනන්ට වඩා ශ්‍රේෂ්ඨ වූහ. වෙළඳ පොළේදී ශබ්ද නගා කතා කළේ නැත, නපුර නපුරෙන් ඉවත් කිරීමේ පුරුද්දක් එතුමා දක්නට ලැබුනේ නැත, සමාව දීම මෛත්‍රී කිරීම වැනි යහපත් ගුණාංග එතුමා තුල දක්නට ලැබුණි. අසාධාරනය අසාධාරනය තුලින් නැති කළේ නැත. නමුත් අල්ලාහ් තආලා විසින් තහනම් කරන ලද දෙයක් (කෙනෙකු විසින් ) ක්‍රියාවට නැංවීම දකින අවස්ථාවේදී එතුමාට අධික ලෙස සධාරන කෝපයක් ඇති විය.

ඕනෑම කටයුත්තක් එය ඉටු කිරීමට මං දෙකක් ඇත්නම් එයින් පවක් සිදු නොවන අකාරයට පහසු මාර්ගය තෝරා ගත්හ. අල්ලාහ්ගේ මාර්ගයෙහි (බහුතර ජනයාගේ සුභ සිද්ධියට විනාශයක් සිදු කිරීමට පෙළෙඹෙන ඕනෑම කෙනෙකුට විරුද්ධව ශුද්ධවූ චේතනාවෙන් එරෙහි වීමට) ජිහාද්හි යෙදුනු නමුත් එතුමා කිසිවිටක වහල් පුද්ගලයකුට කාන්තාවකට, සේවය සේවිකාවන්ට පහර දුන්නේ නැත.

අනස් (රලි) තුමා මෙසේ වාර්තා කරයි. මම මුහම්මද් නබි (ﷺ) තුමාණන්හට අවුරුදු 10 ක් තිස්සේ ආවතේව (සේවය) කළෙමි. කිසිදාක මගේ සිත පෑරෙන ආකාරයේ වචනයක් පවා පැවසුවේ නැත. මා විසින් නොකළ දෙයකට ඇයි නොකලේ යනුවෙන් හෝ කළ දෙයකට එසේ කළේ ඇයිද යනුවෙන් හෝ පැවැසුවේ නැත.

අතිනත දී කෙනෙකු සුහදව පිළිගත් අවස්ථාවේදී හෝ එතුමාණන් පිළිගැනීමට ලක්වූ මොහොතේදී සිය සහෝදරයා ඔහුගේ දෑත මුලින් ඉවත් කලා විනා එතුමා සිය දෑත ඉවත් කර ගත්තේ  නැත.

ඕනෑම කෙනෙකු ප්‍රිය මනාප ලෙස සිනහමුසු මුහුණෙන් පිළිගැනීමට වග බලා ගත්හ. මුහම්මද් නබි (ﷺ) තුමානන් සමග පිළිසඳරක යෙදුනු සෑම දෙනාම එතුමාට ඉතා ලැදි හා ආදරයට ලක්වූ තැනැත්තා තමන් යැයි සිතන තරමට ඕනෑම කෙනෙකුට උසස් පිළිගැනීමක් ලබා දී නෙතින් නෙත ගැටී සෘජුව ඔහුගේ මුහුණ දෙස බලමින් කථා බහ කළහ.

ජරීර් බින් අබ්දුල්ලාහ් (රලි) තුමාණන් මෙසේ පවසයි. මා ඉස්ලාම් ධර්මය වැළඳගත් දින පටන් මුහම්මද් නබි (ﷺ) තුමාණන්ව දුටු සෑම මොහොතකම එතුමාගේ ශුද්ධ වූ මුහුණ සිරියාවන්ත බවින් හා සිනහ මුසු මුහුණෙන් දිස්විය.

අබ්දුල්ලාහ් බින් හාරිස් (රලි) තුමාණන් මෙසේ වාර්තා කරයි. මුහම්මද් නබි (ﷺ) තුමා තරම් සිනහ මුසු මුහුණෙන් දිස් වූ වෙන කිසිදු පුද්ගලයෙකු මා දුටුවේ නැත.

වැය වූ කාලය මෙපමණයි යනුවෙන් කිව හැකි තරමට එතුමාණන්ගේ කථා බහ කෙටි විය. එතුමාණන් පොදු ජනයාට කරුණු අවබෝධ වෙන ආකාරයට සිය දේශනාව පැහැදිලි කළහ. නොකඩවා වේගවත් ලෙස සියළු දේ එකවර පැවැසුවේ නැත. කරුණු වටහා ගැනීම දුෂ්කර තැන් ඇත්නම් ඒවා (දෙවතාවක් හෝ) තුන්වතාවක් පහදා දුන්හ.

කෙනෙකු සම්බන්ධයෙන්  තොරතුරක් ලැබුනු මොහොතක ඒ තැනැත්තා අමතා අසවල් පුද්ගලයා මෙසේ පවසන්නේ මන්දැයි යනුවෙන් එක් පුද්ගලයෙකු දෙසට ඇඟිල්ල දික් කරනවා වෙනුවට බහුතර මෙසේ පවසන්නේ මන්දැයි යනුවෙන් පැවැසීමට පුරුදු වූහ.

මුහම්මද් නබි (ﷺ) තුමාණන් සෑම විටම අල්ලාහ් තආලා සිහි කළහ. සිය මිත්‍ර සහෝදර වරුන් සමග රැස්ව සිටින අවස්ථාවන්හිදී සිය වතාවක් අල්ලාහ් තආලාගෙන් සමාව අයද සිටි බව එතුමාග් සහෝදර මිතුරන් විසින් පවසා ඇත. එනම් :

(رب اغفر لي وتب علي انك انت التواب الرحيم)

**රබ්බිග් ෆිර්ලී වතුබ් අලයිය ඉන්නක අන්තත් තව්වාබුර් රහීම්**
තේරුම: යා අල්ලාහ් මගේ වැරදි සහ පව් සඳහා සමාව අයද සිටිමි ඔබ අපේ පාප ක්‍රියාවන් සඳහා සමාව දෙමින් අපට කරුනාවද දක්වන්නේය.

එතුමා වරක් මෙසේ පැවැසූහ. ඇත්ත වශයෙන්ම මා දවසකට 70 වතාවක් අල්ලාහ්ගෙන් සමාව අයදමින් පාපෝච්චාරනය කරමි.

එතුමා බොහෝ අවස්ථාවන්හිදී පහත සඳහන් දුආ (ප්‍රාර්ථනය) කිරීමට පුරුදු පුහුණු වි සිටියහ.

ربنا آتنا في الدنيا حسنة وفي الآخرة حسنة وقنا عذاب النار

**රබ්බනා ආතිනා ෆිද් දුන්යා හසනතන් වෆිල් ආඛිරති හසනතන් වකිනා අදාබන්නාර්**

තේරුම: අපේ ආරක්ෂකයාණෙනි අපට මෙලොවද අලංකාර කරන්න එලොවද අලංකාර කරන්න.

يا مقلب القلوب ثبت قلبي على دينك

**යා මුකල්ලිබල් කුලූබ් සබ්බිත් කල්බී අලා දීනික**
තේරුම : සිත් සතන් වෙනස් කරන්නාණෙනි ඔබේ ධර්මය කෙරෙහි මගේ සිත ස්ථාවර තත්ත්වයෙහි තබන්න.

රැස්වීමක් අවසානයේදී පහත සඳහන් ප්‍රාර්ථනය කළහ.

سبحنك اللهم وبحمدك أشهد أن لا إله إلا أنت أستغفرك وأتوب إليك

**සුබ්හානකල්ලාහුම්ම වබිහම්දික අශ්හදු අන් ලාඉලාහ ඉල්ලා අන්ත අස්තග්ෆිරුක වඅතුබු ඉලයික.**

තේරුම : යා අල්ලාහ් ඔබ ප්‍රශංසාවට ලක් කිරීම තුලින් මා ඔබ ස්තෝත්‍ර කරමි. ඔබ හැර වන්දනාමානය කිරීමට වෙන කිසි දෙවියෙකු නැති බවට සාක්ෂි දරමි.

මුහම්මද් නබි (ﷺ) තුමාණන් නිවෙස් අඩස්සිය තුල සිටින කන්‍යාවකට වඩා ලැජ්ජා සහ විනය ගරුක වූහ. නමුත් සමාජය තුල නොහොඹිනා අශිෂ්ඨ තැන් දුටුකළ එතුමා සිය මුහුණෙහි ඉරියව් තුලින් එය පිළිකුල් කළහ.

දනට පිනට දීම අතින් මුහම්මද් නබි (ﷺ) තුමාණන් අන් සියළු දෙනා අභිබවා ඉදිරියෙන් සිටියහ. එතුමාගෙන් ආධාර උපකාර පතා පැමිණි කෙනෙකුගේ ඉල්ලීම කිසිවිටක ප්‍රතික්ෂේප කළේ නැත. පුන්‍ය කර්මයක් ප්‍රධානය කිරීමේදී දිළිඳු හා දිළිඳුතාවයට බිය නොවී සාගරයක් සේ අල්ලාහ් උදෙසා දනට පිනට දුන්හ.

පුන්‍ය කර්ම කටයුතු පිළිබඳව එතුමා වරක් මෙසේ දේශනා කළහ. උහද් කඳු වැටිය තරම් රත්‍රං කඳක් දායාදයක් වශයෙන් මට ලැබුනද එයින් මගේ නය බේරා ගැනීමට අවශ්‍ය තරම් ප්‍රමාණයක් ලඟ තබා ගන්නවා විනා ඉතුරු කොටස් දවස් තුනකට වඩා මා සතුව තබා ගැනීමට අකමැති වෙමි.

මුහම්මද් නබි (ﷺ) තුමාණන් ප්‍රඥාශීලී පුද්ගලයෙකු විය. වරක් දරුණු අරාබි ජාතිකයෙකු එතුමාගේ පසු පසින් පැමිණ එතුමාගේ ගෙල තුවාල වන ආකාරයට එතුමාගේ වස්ත්‍රයෙන් ඇද බැන වදින්නටද විය. එම අවස්ථාවේදී උරණ නොවූ එතුමානෝ සිනහමුසු මුහුණින් හා කරුණාවෙන් එම පුද්ගලයා දෙස බලා ඔහුටද යමක් දනට පිනට ප්‍රධානය කරන ලෙස ඉල්ලා සිටියහ.

එතුමා වීර්‍යය අතින් සැම දෙනාටම වඩා බලවික්‍රම වූහ. වීර්‍යය ගුණාංගයට ප්‍රතිමූර්තිය වූ අල් බර්රා බින් මාලික් (රලි) තුමා මෙසේ පවසයි. ශුද්ධ වූ යුද්ධයක් උනුසුම් මුහුණුවරක් ගත් අවස්ථාවකදී එතුමා සතුරන්ට ඉතා සමීපව සිටි අතර අපි එතුමා පිටු පස සිට සටන් කළෙමු. එතුමා හතුරන්ට ලංවෙන මොහොතක අප අතර සිටින සටන් කාමීන් එතුමා අසලට වී සටන් කළහ.

සිය මිත්‍ර (සහාබා) සහෝදරයින්ගේ බොහෝ අවශ්‍යතා ඉටු කර දෙමින් එතුමා පරිත්‍යාග ශීලීව කටයුතු කළේය. බිලාල් වැනි නය බරින් සිටි සහාබාවරුන්ගේ නය තුරස් පියවූහ. සහෝදර සහෝදරියන්ගේ ආවාහ විවාහ කටයුතු ඉටු කර දුන්හ. ජාබිර් නමැති පුද්ලයා යුදෙව් ජාතිකයෙකුට නය වී සිටියදී එම නය පියවීමට කල් ඉල්ලා ඔහු වෙනුවෙන් පෙනී සිටියේය. කාන්තාවක් ඇයගේ ස්වාමි පුරුෂයා ගැන පැමිණිලි කල අවස්ථාවකදී ඔවුන් අතර පැන නැගී ඇති ගැටළු නිරාකරනය කිරීමට වගබලා ගත්තේය. තවත් අවස්ථාවකදී පුද්ගලයෙකු සිය ඔටුවාගෙන් සිදු වන අපහසුතා ගැන පැමිණිලි කළ අවස්ථාවේදී එම ඔටුවා බැහැදැකීමට ගියහ. එවිට එතුමාණන්ට එම ඔටුවා විසින් තම ස්වාමියා තමන්ගෙන් අධික වැඩ ගන්නා බවත් නිසි ලෙස කැම බීම නොදී නොසලකා හරින බවටත් පැමිණිල කරන ලදි. එබැවින් මිනිසුන් පමණක් නොව සතුන්ද එතුමාගෙන් පිළිසරණ පැතීය. ( ග්‍රන්ථය : අහ්මද්)

මෙතුමාගේ මෙම ගුණාංගය ගැන අල්ලාහ් තආලාගේ පහත සඳහන් අල් කුර්ආන් වදනින් සනාථ කරයි. وما أرسلناك إلا رحمة للعالمين (වමා අර්සල්නාක ඉල්ලා රහ්මතන් ලිල් ආලමීන්) තේරුම: (මුහම්මද්) ඔබ ලෝකවාසී සත්වයාට කරුණාව දයාව දක්වන්නෙකු මිස පහළ කළේ නැත. (පරිච්ජේදය : අල් අන්බියා)

මුහම්මද් නබි (ﷺ) තුමාණන් නිහතමානී සහ අවංක පුද්ගලයෙකු වූහ. එතුමාණන් අනාත අසරණ වූවන්ගේ සහ වැන්දඹු කාන්තාවන්ගේ අවශ්‍යතා ඉටු කිරීමට ඇප කැප වී කටයුතු කළ අතර එය තමන්ගේ ගෞරවයට මදි කමක් ලෙස කිසිවිටක නොසිතුහ. වරක් එක් කාන්තාවක් එතුමාගේ අභියසට පැමිණ “ ඔබ තුමා විසින් මගේ අවශ්‍යතාවක් ඉටු කළ යුතුයි” යනුවෙන් පවසන ලදි. එවිට “ ඔබේ අවශ්‍යතාවය ඕනෑම මාර්ගයකින් ඉටු කර දීමට මා සූදානම්ය” යනුවෙන් පවසා ඇයගේ අවශ්‍යතා ඉටු කර දුන්හ.

එපමණක් නොව දිළිඳු දුප්පත් නිවසකින් තත්ත්වයෙන් අඩු කල්ගත වීමේ හේතුවෙන් සුවඳ වෙනස්වූ තෙල් දමා පිසින ලද අහාරයක් අනුභව කිරීම සඳහා කැඳවීමක් ලැබුනද එයට සහභාගිවී එම ආහාර අනුභව කළහ.

එතුමා වරක් මෙසේ පැවැසූහ : මට ප්‍රමිතියෙන් අඩු තත්තවයෙන් බාල ආහාරයක් ත්‍යාගයක් ලෙස ප්‍රධානය කළද එය භාර ගනිමි, ඒ සඳහා ආරාධනාවක් ලැබුනු කල එයට සහභාගි වෙමි. එතුමානන්ට අයිති වටිනා පලිහක් යුදෙව්වෙකු වෙත උගසට තබන ලදි, එතුමාගේ වියෝවය දක්වා එය නැවත බේරා ගැනීමට තරම් ධන ශක්තියක් එතුමාට නොතිබිණි.
එතුමා කුඩා දරුවන්හට ආදරය කරුණාව දැක්වූහ. තවද ඔවුන් සමග එකතු වී කෙළි සෙල්ලම්ද කළේය. අනස් (රලි) තුමාණන් මෙසේ දේශනා කළහ. මුහම්මද් නබි (ﷺ) තුමාණන් මෙන් පවුලේ ඥාතීන් සමග සුහදව කටයුතු කළ වෙන කිසිවෙකු මම දුටුවේ නැත. එතුමා කුඩා දරුවන් අතරට පැමිණ ඔවුන්ට සලාම් ආශිර්වාදය කිරීමට පුරුද්දක් කර ගත්හ.

(“යවමුන් මඅ හබීබික” යන පොතෙන් උපුටා ගන්නා ලදි.)